---

**ණය මණ්ඩලය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ණය මණ්ඩලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිලිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 12 අනුව 2011 පෙබරවාරි 28 දින හෝ ඊට පෙර මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කලයුතු නමුත් එම ගිණුම් 2012 අගෝස්තු 20 දින එනම් අවුරුදු 01යි මාස 05ක් සහ දින 22 ක් ප්‍රමාද වී විගණනයට ඉදිරිපත් කර තිබුණි.

2009 වර්ෂය දක්වා ගිණුම් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සනින් විගණනයට ඉදිරිපත් කර තිබූ නමුත් 2010 වර්ෂයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයකුගේ අත්සන යටතේ විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මණ්ඩලය විසින් අනුගමනය කර තිබුණු ගිණුම්කරණ ප්‍රතිපත්ති, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

#### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

නිවාස සහ දේපළ ණය ගිණුම හා දිස්ත්‍රික් උසාවි නඩු කියන්නන්ගේ ගිණුම සඳහා උපලේඛණ නොමැතිව ණය මණ්ඩල අවසාන ගිණුම් සකස් කර තිබීම නිසා එක් එක් ණය ශේෂ පිලිබඳ විගණනය කල නොහැකි විය.

### 1.2.4 නොසැසඳූ ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු රජයේ දිසාපති ගිණුම, ණය මණ්ඩල පොලී ගිණුම, පොලී සංචිත හා ක්ෂය අරමුදල් ගිණුම සහ සංචිත හා ක්ෂය අරමුදල් ගිණුම යන ගිණුම්වල පිලිවෙලින් රු.22,663,852, රු.86,124,779, රු.7,210,141 සහ රු.3,606,500 ක් වූ නමුත් භාණ්ඩාගාර පොත්වල ඒවාට අනුරූප ශේෂයන් දක්නට නොලැබුණි. වෙනස්කම් සසඳා නිවැරදි කිරීමටද කටයුතු කර නොතිබුණි.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.22,663,852ක් වූ රජයේ දිසාපති ගිණුම රු.748,452ක් වූ ලැබිය යුතු නිවාස හා දේපල ණය හා පොලිය, රු.111,154,991 ක් වූ ආයෝජන, රු.41,704,045ක් වූ දිස්ත්‍රික් උසාවි නඩු කියන්නන්ගේ මුදල හා රු.86,124,779ක් වූ ණය මණ්ඩල පොලී ගිණුම සඳහා විස්තරාත්මක උපලේඛණ, අදාල පාර්ශවයන්ගේ සනාථ කිරීම්, පැවරුම් ඔප්පු, මිනුම් සැලසුම්, උපයෝගී ලේඛණ, ආයෝජන සහතික, ආයෝජන ලේඛණ සහ ශේෂ පිරික්සුමේ සඳහන් කිසිදු අයිතමයක් සඳහා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් යනාදිය නොමැතිවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය/සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල දිගින් දිගටම ඉදිරියට ගෙනා රු.18,650ක අතිරික්තයක් විය.

### 2.2 කළමනාකරණ දුර්වලතා

(අ) 2009 විගණන වාර්තාවේ දක්වා තිබූ නිවාස හා දේපල ණයගැතියන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.748,452 ක හිඟ ණය වාරික හා පොලී අයකර ගැනීමට මණ්ඩලයට වාසිදායක නඩු තීන්දුවක් ලබා දී තිබියදී මෙම මුදල් අයකර ගැනීම කඩිනම් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) එම ගිණුම්වල ඇත මුදල් සඳහා පොලී ගෙවීමේ ක්‍රමවේදයක සකස් කිරීමට කටයුතු කර තිබූ බවද තහවුරු නොවීය.

## 2.3 ණය මණ්ඩල ඇවර කිරීමේ කටයුතු

ණය මණ්ඩල ඇවර කිරීමේ කටයුතු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව යටතේ 1976 වර්ෂය තුළදී ආරම්භ කර තිබුණු අතර, 2001 වර්ෂයේ සිට එම කටයුතු රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කර ඇත. පසුගිය වර්ෂ කිහිපය තුළදී කොමසාරිස්වරුන්ගේ මණ්ඩලය රැස්ව නොතිබුණි.

ණය මණ්ඩලයේ ඇවර කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමට පෙර පහත සඳහන් කාර්යයන් අවසන් කල යුතුව ඇත.

(අ) සක්‍රීය නඩු තැන්පත් සඳහා සාධාරණ ලාභාංශ හෝ පොලී තීරණය කිරීම. (1996 සිට ලාභාංශ නොමැත).

(ආ) නිවාස ණය ශේෂ වලට අදාල අය විය යුතු ණය ශේෂයන් හා එම ශේෂ මත අයවිය යුතු පොලිය අයකර ගැනීම.

(ඇ) 1973 අංක 33 දරන ණය මණ්ඩල (සංශෝධන) පනත මගින් සංශෝධිත ණය මණ්ඩල ආඥා පනත (311 අධිකාරය) ඇවර කිරීමේ කටයුතු සඳහා සුදුසු පරිදි සංශෝධන සිදු කිරීම.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) දිස්ත්‍රික් උසාවි නඩු කියන්නන්ගේ තැන්පතු

(ආ) ලෙජර් ගිණුම් පවත්වාගෙන යාම

(ඇ) ඇවර කිරීමේ කටයුතු